LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය

# නව නීති සහ විධායක තීරණ පිළිබඳ යාවත්කාලීන කිරීම
# - 2026 අප්‍රේල් -


12th May 2026

LAW TRACKER

# නව නීති සහ විධායක තීරණ පිළිබඳ යාවත්කාලීන කිරීම - 2026 අප්‍රේල්

*සාරාංශය* | *2026 මැයි 12*

## ශ්‍රී ලංකාවේ නීති සම්පාදන ක්‍රියාවලිය




## 2026 අප්‍රේල් මාසයේ යාවත්කාලීන කිරීම්

## I. සහතිකය සටහන් කරන ලද පනත් කෙටුම්පත්

**2026 අංක 10 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත** (2026 අප්‍රේල් මස 9 වන දින පාර්ලිමේන්තුවේ දී කථානායකවරයා විසින් සහතිකය සටහන් කරන ලදී) - මෙමගින් 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කරයි. 2026 ජූලි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලියාපදිංචි කිරීමේ සහ ලියාපදිංචියෙන් ඉවත් වීමේ සීමා පැහැදිලි කරයි. මෙයට පෙර සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කරන ලද මෝටර් රථ ආනයන 2026 මැයි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි එම බද්දට යටත් වේ.

## II. ගැසට් පත්‍රයේ පළකරන ලද පනත් කෙටුම්පත්

1. **2026 අංක 31 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 අප්‍රේල් 29) - මෙමගින් 2026 ජූලි මස 1 වන දින සිට වැට් බදු සඳහා ලියාපදිංචි කිරීමේ සීමාව කාර්තුවකට රු.මි. 9 / වසරකට රු.මි. 36 දක්වා අඩු කරයි. වැට් බදු ගෙවීමේ බැඳීම් අනේවාසික ඩිජිටල් සේවා සපයන්නන් දක්වා පුළුල් කරයි. මූල්‍ය සේවා සඳහා වැට් බදු අනුපාතය 18% සිට 20.5% දක්වා ඉහළ නංවයි. විකුණුම් ස්ථාන යන්ත්‍ර භාවිතය අනිවාර්ය කිරීමට විධිවිධාන සලසයි. 2025 ඔක්තෝබර් 1 වන දින සිට අතීතයට බලපැවැත්වෙන පරිදි බදු පැහැර හැරීම සඳහා වන දඩුවම් ඉහළ නංවයි.
2. **2026 අංක 27 දරන මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 අප්‍රේල් 23) - මෙමගින් 2026 ජනවාරි 1 වන දින හෝ ඊට පසු වාණිජ මෙහෙයුම් ආරම්භ කරන, අලුතින් ඉදිකරන ලද දුරකථන සන්නිවේදන කුළුණු වසර පහක කාලයක් සඳහා දුරකථන සන්නිවේදන කුළුණු බද්දෙන් නිදහස් කරයි.
3. **2026 අංක 28 දරන විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 අප්‍රේල් 23) - මෙමගින් සියලුම විදුලිසංදේශ සේවා සැපයුම්කරුවන් සඳහා (බලපත්‍රලාභී ක්‍රියාකරුවන් සඳහා පමණක් නොව) බද්ද දීර්ඝ කරයි. බදු පදනම නැවත අර්ථ දක්වයි, බොල්-ණය අඩු කිරීම් සඳහා විධිවිධාන හඳුන්වා දෙන අතර, ඓතිහාසික බදු අනුප්‍රමාණ සැලැස්මක් (2011 සිට මේ දක්වා) සකස් කරයි.
4. **2026 අංක 26 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 අප්‍රේල් 22) - මෙමගින් ජාතික පාරිසරික පනත ප්‍රධාන වශයෙන්ම ප්‍රතිසංස්කරණය කරයි. මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රතිව්‍යුහගත කර, උපායමාර්ගික පාරිසරික ඇගයීම්, විස්තීර්ණ නිෂ්පාදක වගකීම, උපද්‍රවකාරී අපද්‍රව්‍ය බලපත්‍ර ලබාදීම සහ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත් කිරීම සඳහා එහි බලතල පුළුල් කරයි. අප ජල බැහැර කිරීමේ ගාස්තු හඳුන්වා දෙයි. දඬුවම් සැලකිය යුතු ලෙස වැඩි කරයි; ඇතැම් වැරදි cognizable සංජානනීය වැරදි බවට පත් කරයි.

## III. පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පනත් කෙටුම්පත්

1. **2026 අංක 29 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 අප්‍රේල් මස 9 වන දින සභාගත කරන ලදී). මෙමගින් ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳ අර්ථ දැක්වීම පුළුල් කරයි. ශ්‍රී ලංකාව ඉලක්ක කරගත්, ශ්‍රී ලංකාවේ දේශසීමාවෙන් පිටතදී සිදුකරන වැරදි සඳහා පනත අදාළ වේ. තහනම් කිරීමේ නියෝග වැඩි දියුණු කරන අතර පොලිසියේ විමර්ශන බලතල පුළුල් කරයි.

2. **2026 අංක 30 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 අප්‍රේල් මස 9 වන දින සභාගත කරන ලදී). මෙමගින් සමූල ඝාතන අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද ආවරණය කිරීම පිණිස මුදල් විශුද්ධිකරණය / ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම වැළැක්වීමේ රාමුව පුළුල් කරයි. මූල්‍ය බුද්ධි ඒකකය රු.මි. 200 දක්වා තහනම් කිරීමේ බලතල සහිත ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය කරයි. අපරාධ වගකීම වැඩි කරයි.

## IV. තෝරාගත් අමාත්‍ය මණ්ඩල තීරණ

### ජාත්‍යන්තර කටයුතු සහ ද්විපාර්ශ්වික සහයෝගීතාවය

1. කෘෂිකර්මාන්තය, බලශක්තිය, දේශගුණික විපර්යාස සහ පාරිසරික තිරසාරභාවය යන ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ට ශිෂ්‍යත්ව ලබා දීම සඳහා තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනය (Asian Institute of Technology) සමග අවබෝධතා ගිවිසුම (අගෝස්තු 2026-2031). (2026 අප්‍රේල් 4)
2. මාලදිවයිනේ ජනාධිපතිවරයාගේ රාජ්‍ය සංචාරයේ දී (2026 මැයි 3 - 5) ආරක්ෂක පුහුණු, අධ්‍යාපන, සෞඛ්‍ය, සංචාරක, ලේඛනාරක්ෂක සහ ක්‍රීඩා ක්ෂේත්‍රවල සහයෝගීතාවය ආවරණය වන පරිදි අවබෝධතා ගිවිසුම් හයක් අත්සන් කිරීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 27)

### අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන

1. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා රු.මි. 663 ක සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව අනුමත කරන ලදී (2018 වර්ෂයේ දී අනුමත කරන ලද රු.මි. 486 සිට වැඩිවූ මුදල). (2026 අප්‍රේල් 20)
2. රු.මි. 289 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ වාණිජ අධ්‍යාපනය සඳහා දිස්ත්‍රික්කයකට එකක් බැගින් වන සේ ප්‍රාදේශීය ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් මධ්‍යස්ථාන 25 ක් පිහිටුවීම (2026-2028). (2026 අප්‍රේල් 20)
3. ශ්‍රී ලංකාව සඳහා ජාතික ක්ෂුද්‍ර-අක්තපත්‍ර ප්‍රතිපත්තියක් සහ රාමුවක් සකස් කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම (Commonwealth of Learning) සංවිධානය සමග ගිවිසුමක් අත්සන් කිරීම අනුමත කරන ලදී; 2026 මැයි මාසයේදී කොළඹදී පැවැත්වීමට නියමිත වැඩමුළුව. (2026 අප්‍රේල් 27)

### මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන

1. නීතිපතිවරයා විසින් අනුමත කරන ලද, එකතු කළ අගය මත බද්ද (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත (විදුලිසංදේශ කුළුණු සඳහා බදු නිදහස් කිරීම) ගැසට් පත්‍රයේ පළකිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 4)
2. ඉන්ධන මිලෙන් බලපෑමට ලක් වූ කණ්ඩායම් සඳහා අතිරේක ඉලක්කගත සහන අනුමත කරන ලදී: විශේෂ අස්වැසුම දීමනා (පවුලකට රු. 2,500 - 7,500); ඒකක 90 ට අඩු විදුලි පාරිභෝගිකයින් සඳහා විදුලි පිරිවැය අවශෝෂණය කිරීම; පොහොර සහනාධාර වැඩි කිරීම; ධීවර ඉන්ධන සහනාධාරය ලීටරයකට රු. 50; සහ කුඩා තේ වගාකරුවන් සඳහා අමතර දීමනා. (2026 අප්‍රේල් 4)
3. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් සේවා මෙහෙයුම්කරුවන් සඳහා නැවත අඩිය පුරවන ලද ගුවන් යානා ටයර් (එච්.එස්. කේතය 4012.13) ආනයනය කිරීම සඳහා අවසර දෙන ආනයන රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 20)
4. රජයේ ආයතනවල සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන රාජ්‍ය අංශයේ 9,800 ක් පමණ වූ තාවකාලික සහ අනියම් සේවකයන් සඳහා ස්ථිර පත්වීම් ලබා දීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 27)
5. ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාලේඛන රැස් කිරීම පිළිබඳ රීති (2026 අංක 01) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී; 2025 වර්ෂය සඳහා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ මෙහෙයුම් වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 27)

### ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන

1. ගාලු කොටුවේ පවතින අධිකරණ සංකීර්ණය බෙලිගහ ප්‍රදේශයේ ස්ථාපනය කිරීම; දැනට පවතින ගොඩනැගිලි මහ ගාල්ල සංවර්ධන සැලැස්ම (2021-2030) යටතේ සංචාරක අංශයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත් ව්‍යාපෘතියක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියට පවරා දීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 6)
2. 2025 අංක 8 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව (සංශෝධන) පනතට අනුකූලව අන්තර්-පළාත් මගී ප්‍රවාහන බලපත්‍ර සඳහා සංශෝධිත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 20)
3. තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් නවෝත්පාදන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වසර 50 ක බදු පදනම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය සතු කොළඹ 10, මරදාන පාරේ පිහිටි ඉඩම (අක්කර 1, රූඩ් 1, පර්චස් 12.4) සඳහා ආයෝජන යෝජනා කැඳවීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 27)

### සෞඛ්‍ය

1. දඹුල්ල ප්‍රධාන සංවර්ධන සැලැස්ම යටතේ දඹුල්ල මූලික රෝහල (ඇඳන් 354, මධ්‍යම පළාත) අක්කර 5 ක නව භූමියකට ගෙන යාම සඳහා එම රෝහල මධ්‍යම රජයට පවරා ගැනීම; ඇස්තමේන්තුගත පිරිවැය රු. බි. 5 කි. (2026 අප්‍රේල් 27)
2. අන්තර්ගතය කළමනාකරණය කිරීම, ප්‍රවෘත්ති බෙදා හැරීම සහ ප්‍රේක්ෂක විශ්ලේෂණ සඳහා ස්වාධීන රූපවාහිනී ජාලය (ITN) තුළ ඩිජිටල් ඒකකයක් ස්ථාපනය කිරීම. (2026 අප්‍රේල් 27)

### බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු

1. සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීම අනුමත කරන ලදී: බෞද්ධ, හින්දු සහ ක්‍රිස්තියානි ආගමික ස්ථාන ආවරණය වන පරිදි සම්පූර්ණයෙන්ම විනාශ වූ ස්ථාන සඳහා රු.මි. 7.5 දක්වා සහ අර්ධ වශයෙන් හානි වූ ස්ථාන සඳහා රු.මි. 5 දක්වා ගෙවීම. (2026 අප්‍රේල් 27)

2. 2026 මැයි 2-10 කාලය තුළ මහජනයාට වන්දනා කිරීම සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ ටෙක්සාස් ප්‍රාන්තයේ මහා විපස්සනා භාවනා මධ්‍යස්ථානයට ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේ නමක් ලබා දීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 20)

## ආරක්ෂක

1. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් නිවාස සම්පූර්ණයෙන්ම හානි වූ, අර්ධ වශයෙන් හානි වූ හෝ නායයෑමේ අවදානමට ලක්ව ඇති වතු අංශයේ සේවකයින් සඳහා රු.මි. 5 ක නිවාස ප්‍රදානයක් ලබාදීම අනුමත කරන ලද අතර, ඒ සඳහා වතු සමාගම විසින් පර්චස් 10 ක ඉඩමක් ලබා දෙනු ලැබේ. (2026 අප්‍රේල් 4)
2. පාස්කු ඉරිදා ප්‍රහාර සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ කමිටුවක් පිහිටුවීම අනුමත කරන ලදී; 2021 වර්ෂයේ දී මුල් කැබිනට් අනුමැතිය ලබා දීමෙන් පසුව මෙතෙක් අධීක්ෂණ යාන්ත්‍රණයක් පැවතී නොතිබුණි. (2026 අප්‍රේල් 20)
3. දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් පවුල් 1,000 ක් සඳහා (කෑගල්ල, මහනුවර, නුවරඑළිය, බදුල්ල දිස්ත්‍රික්කවල) දැනට ලබා දෙන රු. 25,000 ක මාසික කුලී දීමනාවට අමතරව ශ්‍රී ලංකා යුද හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් අන්තර්කාලීන නිවාස ඉදිකරදීම අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 27)

## නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන

1. 'සුවපහසු නිවසක් - සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්' රාමුවට අනුකූලව විශේෂඥ කමිටුවක් විසින් ජාතික නිවාස ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම අනුමත කරන ලදී (අවසන් වරට සංශෝධනය කරන ලද්දේ 2019 වර්ෂයේ දී ය). (2026 අප්‍රේල් 20)
2. මේ වන විට නිවාස ඒකක 10,532 ක් පමණක් සම්පූර්ණ කර ඇති, සැලසුම් කරන ලද නිවාස ඒකක 64,407 ක් ආවරණය වන පරිදි දැනට ඇණහිට තිබෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස ව්‍යාපෘති 2,562 ක් (2015-2019) සමාලෝචනය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත කරන ලදී; මෙම ව්‍යාපෘති නිම කිරීම සඳහා අවශ්‍ය වන ඇස්තමේන්තුගත අමතර පිරිවැය රු. බි. 11.26 කි. (20 අප්‍රේල් 2026)

## මහජන ආරක්ෂක සහ ආගමන

වර්තමානයේ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල පවතින නේවාසික ධාරිතාව ඉක්මවා යමින් ඉල්ලුම වැඩිවී ඇති බැවින්, 'රටම එකට' වැඩසටහන යටතේ 'ඌන උපයෝජිත' රජයේ ගොඩනැගිලි හයක් කෙටි කාලීන මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීම අනුමත කරන ලදී. (20 අප්‍රේල් 2026)

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන

කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකා කාර්මික පරිවර්තන සහ නවෝත්පාදන අධිකාරිය පිහිටුවීම සඳහා පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දෙන ලදී. (2026 අප්‍රේල් 20)

## පරිසර

වාණිජ පරිමාණයෙන්, නීති විරෝධී සහ අධික ලෙස භූගත ජලය සහ මතුපිට ජලය ලබා ගැනීම නියාමනය කිරීම සඳහා 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දෙන ලදී. (2026 අප්‍රේල් 4)

## ඩිජිටල් ආර්ථික

රජයේ ඩිජිටල් ප්‍රසම්පාදනය නවීකරණය කිරීම සඳහා අදියර තුනකින් (2026-2027) ඩිජිටල් පොදු යටිතල පහසුකම් සහ GovTech App යෙදුමක්/සේවා වෙළඳපොළක් ස්ථාපනය කිරීම සඳහා රු. මි. 563 ක ව්‍යාපෘතියක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 4)

## ක්‍රීඩා

ජාතික මට්ටමෙන් කීර්තියක් දිනාගෙන ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විනිවිද භාවයෙන් යුතුව, කුසලතා මත පදනම් ව, රජයේ සහ ව්‍යවස්ථාපිත ආයතනවල රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති රාමුව අනුමත කරන ලදී. (2026 අප්‍රේල් 4)

---

*වියාචනය - නීතිය හා සමාජ භාරය විසින් මෙම ලියවිල්ල සකස් කර ඇත. මෙය කෙටි සාරාංශයක් පමණක් වන අතර, මෙහි කිසිදු නෛතික හෝ ප්‍රතිපත්ති විශ්ලේෂණයක් අඩංගු නොවන බැවින්, නීති උපදෙස් ලෙස මෙය කෙරෙහි විශ්වාසය නොතැබිය යුතුය. නීති සහ තීරණ පිළිබඳ විස්තර ඒවායෙහි මුල් පිටපත් පදනම්කර ගෙන සකස් කර ඇත. නිවැරදි කිරීම් හෝ පැහැදිලි කර ගැනීම් සඳහා සම්බන්ධ කර ගන්න: tegal.lawchambers@gmail.com*